# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1592/ 2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 16/10/2024<br>පැය 1505 |

## මාධ්‍ය නිවේදනය

### නාඳුනන මෘත ශරීරයක් හඳුනා ගැනීම සඳහා මහජන සහය පැතීම.

2024.10.04 වන දින කෑගල්ල පොලිස් වසමේ කොළඹ මහනුවර ප්‍රධාන මාර්ගයේ කි.මී 83 කණුව ආසන්නයේ මොලගොඩ ප්‍රදේශයේදී සිදු වූ රිය අනතුරකින් මාර්ගය හරහා ගමන් කල පදිකයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කෑගල්ල රෝහලට ඇතුලත් කිරීමේදී මිය ගොස් ඇත. මෘත ශරීරය මේ වන විට කෑගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

මිය ගිය පුද්ගලයා සම්බන්ධයෙන් මෙතෙක් අනන්‍යතාවය තහවුරු වී නොමැති අතර රූප විස්තර මෙසේය,

**උස අඩි 05 අගල් 03යි.**
**තළෙළු, සිහින් සිරුර,**
**හිසේ ඉදිරිපස තට්ටය පෑදී ඇති අතර හිසේ පිටුපස කොටසේ අඟලක් පමණ දිගට කොණ්ඩය වැවී ඇත.**
**දකුණු ඇඟිබැමට ඉහලින් නළලේ සුව වූ රවුම් හැඩැති තුවාල කැළලක් දක්නට ඇත.**
**අවසන් වරට සුදු පැහැති අත් කොට කමිසයක් සහ රතු සහ නිල් පැහැති ඉරි සහිත සරමක් ඇඳ සිට ඇත.**

මිය ගිය අයගේ ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර මේ සම්බන්ධව ඔබ මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් යම් තොරතුරක් වෙතොත් පහත සඳහන් දුරකථන අංක වෙත දැනුම් දෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

- කෑගල්ල පොලිස් ස්ථානාධිපති - 0718591413
- කෑගල්ල පොලිස් ස්ථානය - 0352222222





**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**